## 11. පච්ඡාජාත ප්‍රත්‍යයේ ත්‍රිරාශිය

පඤ්චවෝකාර භූමියෙහි උපදනා වූ අරූප විපාක වර්ජිත ප්‍රථම භවාංගාදි පශ්චිම වූ සිත් පස් අසූව ය, චෛතසික දෙපණස ය යන මොවුහු පච්ඡාජාත ප්‍රත්‍යය ධර්මයෝ ය.

ප්‍රතිසන්ධ්‍යාදි පූර්ව පූර්ව සිත් හා ඉපිද රූපස්ථිතියට පැමිණි ඒකජ කාය ය, ද්විජ කාය ය, ත්‍රිජ කාය ය, චතුජ කාය ය යන මොවුහු පච්ඡාජාත ප්‍රත්‍යයේ ප්‍රත්‍යයෝත්පන්න ධර්මයෝ ය.

ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි වශයෙන් ලැබෙන සියලු එකුන්අනූ චිත්ත ය, චෛතසික දෙපණස ය, පශ්චිම නාම ස්කන්ධයන් හා උපදනා චිත්තජ රූපයෝ ය, බාහිර රූපයෝ ය, ආහාරජ රූපයෝ ය, ඍතුජ රූපයෝ ය, අසංඥ සත්ත්ව කර්මජ රූපයෝ ය, ප්‍රවෘත්ති කර්මජ රූපයෝ ය යන මොවුහු පච්ඡාජාත ප්‍රත්‍යනීක ධර්මයෝ ය. තවත් ක්‍රමයකින් කියතහොත් මෙසේ ය. සියලු එකුන්අනූ චිත්ත ය, චෛතසික දෙපණස ය, බාහිර රූපයෝ ය, අසංඥ සත්ත්ව කර්මජ රූපයෝ ය. නිරෝධසමාපත්ති වීථියෙහි අන්තිම නේවසඤ්ඤානාසඤ්ඤායතන ජවනය හා උපදනා චිත්තජ රූපයෝ ය, ඒ අන්තිම ජවනයෙන් පසු නිරෝධ සමාපත්තියෙන් නැගිටීමෙහි දී ඇති වන අනාගාමී අර්හත් ඵල චිත්තයන් ඇති වීමට පෙර ඒ සන්තානයෙහි ඉපිද නිරුද්ධ වන ආහාරජ රූපයෝ ය, ඍතුජ රූපයෝ ය, ප්‍රවෘත්ති කර්මජ රූපයෝ ය, ච්‍යුති චිත්තය හා උපදනා චිත්තජ රූපයෝ ය, ඍතුජ රූපයෝ ය, ආහාරජ රූපයෝ ය යන මොවුහු පච්ඡාජාත ප්‍රත්‍යයාගේ ප්‍රත්‍යනීක ධර්මයෝ ය.

---

**පච්ඡාජාත පච්චයො** - "පච්ඡා ජායතීති පච්ඡාජාතො" පච්ඡා - ප්‍රත්‍යයෝත්පන්නයෙන් පසුව, ජායති - පහළ වේ, ඉති - එබැවින්, පච්ඡාජාතො - පච්ඡාජාත නම් වේ. ප්‍රත්‍යයෝත්පන්න ධර්මයන්ට පසුව පහළ වන්නා වූ, පෙර පවතින්නා වූ ප්‍රත්‍යයෝත්පන්න ධර්මයන්ට උපකාරක ශක්තිය පච්ඡාජාත ප්‍රත්‍යය වේ. අටුවාවෙහි මෙම පච්ඡජාතා ප්‍රත්‍යය ගිජුලිහිණි පෝතකයන්ගේ ආහාරාශාවට උපමා කොට ඇත. ගිජුලිහිණියන් ආහාර ගැනීමෙන් අනතුරුව කැදැල්ලෙහි සිටිනා ගිජුලිහිණි පෝතකයන්ට ආහාර රැගෙන එන පුරුද්දක් නැත. ගිජුලිහිණි පෝතකයෝ දෙමවුපියන් නැවත පැමිණියහොත් තමාට ආහාර ගෙන එති'යි අපේක්ෂාවෙන් සිටිත් යැයි කියනු ලබයි. මෙසේ ආහාරයෙහි අපේක්ෂාව නම් වූ රසතණ්හාවට "ආහාර ආශා චේතනාව" යැයි කියනු ලබයි. ආහාර අනුභව නොකර සිටින මෙම අවස්ථාවේ දී මෙම ආහාර ආශා චේතනාව නම් වූ අපේක්ෂාව ගිජුලිහිණි පෝතකයන්ගේ ශරීරයට

උපකාර කරන බැවින් ගිජුලිහිණි පෝතකයන්ගේ ශරීරය මනාව පවතිමින් තමා ආහාර සොයන අවස්ථාවේ දී ස්ථායී භාවයෙන් පවතියි. මෙහි අදහස නම් ආහාර නොමැති වුවහොත් මරණයට පත් වේ. එසේ වුව ද ගිජුලිහිණි පෝතකයන්ගේ ආහාරාශා චේතනාවගේ උපකාරය හේතුවෙන් මරණයට පත් නොවී පවතියි" යන්න යි. (මෙම ආහාරාශා චේතනාව අන් කවරක්වත් නොව පච්ඡාජාත චිත්ත චෛතසිකයන්හි ඇතුළත් වන්නා වූ චේතනා චෛතසිකය යි.) එබැවින් මෙය හුදෙක් ආහාරාශා චේතනාවෙන් උපමා දැක්වීමක් පමණක් නොව, උපමාවෙහි දී ද ලැබෙන පච්ඡාජාත ශක්තියෙන් උපකාර වීම දක්වයි. නිවැරදිය - ගිජුලිහිණි පෝතකයන්ගේ ආහාරාශා චේතනාව ස්වකීය උත්පාදයට ප්‍රථමයෙන් පහළ වී ස්ථිති ක්ෂණයට පැමිණි ශරීරයේ ඇති රූප සමූහයට ස්වකීය උත්පාද අවස්ථාවේ දී පච්ඡාජාත ශක්තියෙන් උපකාරක වේ.

**ප්‍රත්‍ය ප්‍රත්‍යයෝත්පන්න** - ප්‍රත්‍ය ධර්මයන්හි "පඤ්චවෝකාර භූමියෙහි උපදනා වූ" යන වාක්‍ය ඛණ්ඩයෙහි අදහස නිශ්‍රය ප්‍රත්‍යයේ කී පරිද්දෙන් දත යුතු වේ. ප්‍රත්‍යයෝත්පන්නයෙහි "ඒකජ කාය ය" ආදිය රූප පරිච්ඡේදයේ රූප ප්‍රවෘත්ති ක්‍රම විස්තරය අනුව දක්වා ඇත.

මෙම පට්ඨාන ත්‍රිරාශිය දක්වන ආචාර්යයන් වහන්සේලා සහ තවත් ඇතැම් ආචාර්යයන් වහන්සේලා "ප්‍රතිසන්ධි සිතේ ස්ථිති ක්ෂණයට පැමිණි විට පච්ඡාජාත ප්‍රත්‍යයේ උපකාරය ලැබේ ය" යන මතය දරති. ඒකජ කාය යනු ප්‍රතිසන්ධි සිත සමඟ එකට ඉපිද ප්‍රතිසන්ධියේ ස්ථිති ක්ෂණයට ඇති කර්මජ රූප සමූහය යි. (එක - එක් හේතුවක් නිසා + ජ - පහළ වන = කාය - රූප සමූහය) ඒ ආචාර්යයන් වහන්සේලාගේ අදහසට අනුව ද්විජකාය යනු ප්‍රතිසන්ධි සිතේ භඞ්ග ක්ෂණයේ දී ඇති රූප සමූහය යි. එම ක්ෂණයේ දී කර්මජ සහ ඍතුජ රූප සමූහයන් යන හේතු දෙකක් නිසා පහළ වූ රූප දෙවර්ගය ම ස්ථිති ක්ෂණයට පැමිණ ඇත. ත්‍රිජකාය යනු ප්‍රතිසන්ධි සිතෙන් අනතුරුව ප්‍රථම භවාංගයේ ස්ථිති ක්ෂණයේ ඇති රූප සමූහය යි. එම ක්ෂණයේ දී කර්මජ, ඍතුජ, චිත්තජ යන වර්ග තුන ම ස්ථිති ක්ෂණයට පැමිණ ඇත. චතුජකාය යනු ආහාරජ රූපයේ උත්පාදයෙන් අනතුරුව ස්ථිති ක්ෂණයට පැමිණ සිටින්නා වූ රූප සමූහය යි. (ආහාරජ රූප උපදනා කාලය සඳහා භාෂාටීකාවේ රූප ප්‍රවෘත්ති ක්‍රමය කොටස කියවන්න.) ඒ අවස්ථාවේ පටන් කාමභූමියේ දී නිරෝධ සමාපත්තියට සමවදින අවස්ථාව හැර සෑම අවස්ථාවකදී ම චතුජකාය පවතියි. රූපභූමියේ

දී සෑම අවස්ථාවක දී ම ත්‍රිජකාය පමණක් පවතියි. මෙසේ ත්‍රිරාශිය දක්වන්නා වූ ආචාර්යයන් වහන්සේලා රූප ප්‍රවෘත්ති ක්‍රමයට අනුව බලමින් ඒකජකාය ආදී වශයෙන් බෙදා දක්වා පෙන්වූහ.

**ත්‍රිරාශිය පිළිබඳ ඇති වාක්‍යයන් විමසීම -** "ප්‍රතිසන්ධ්‍යාදි පූර්ව පූර්ව සිත් හා ඉපිද රූපස්ථිතියට පැමිණි" යැයි ත්‍රිරාශියේ දැක්වේ. එම වාක්‍ය ඛණ්ඩයට අනුව පෙර පෙර සිත් සමඟ එකට උපදනා රූපයන් පමණක් පසු පසු සිත් මගින් ප්‍රත්‍යය වේ ය යන අදහස ලැබේ. පෙර පෙර සිතේ ස්ථිති භඞ්ගයන් සමඟ උපදනා රූපයන් ප්‍රත්‍යය ලැබේ ය යන අදහසට නො පැමිණේ. තව ද එම ත්‍රිරාශියේ ඇති වචනයට අනුව ගතහොත් පෙර පෙර සිත් සමඟ එකට උපදනා රූපයන්ට මතු දෙවන තුන්වන ආදී සෙසු සිත්වලින් (පසු සිතට පසුව උපදනා සිත්) උපකාර කළ නොහැකි වේ. උදා - "අතීත භවාංගය හා එක්ව උපදනා රූපයට භවාංග චලනය විසින් පමණක් උපකාර කරන අතර භවාංගුපච්ඡේද පඤ්චද්වාරාවර්ජන ආදිය විසින් උපකාර කළ නොහැකි වේ" යන අදහසට පැමිණේ. සත්‍යය වශයෙන් කිවහොත් පසු පසුව සිත් පහළ වන වාරයක් වාරයක් පාසා ශරීරයේ ඇති ඉපිද ස්ථිතියට පැමිණියා වූ කර්මජ, චිත්තජ, ඍතුජ, ආහාරජ රූපයන්ට උපකාරක වන ශක්තිය පච්ඡාජාත ශක්තිය යැයි කීම හේතුවෙන්, පෙර පෙර සිත්වල උත්පාද, ස්ථිති, භඞ්ග සමඟ උපදනා සියලු ම රූපයන් නිරුද්ධ වීමට පෙර පසු පසු සිත් මඟින් නැවත නැවතත් උපකාර කරනු ලබයි. මෙම අදහස ත්‍රිරාශියේ දී ප්‍රකට නොවනුයේ නමුදු පෙළ අටුවාවන්හි පැහැදිලිව දක්වා ඇත.

පාළිය - පච්ඡාජාතා චිත්තචෙතසිකා ධම්මා පුරෙජාතස්ස ඉමස්ස කායස්ස පච්ඡාජාතපච්චයෙන පච්චයො.

අටුවා - ඉමස්ස කායස්සාති ඉමස්ස චතුසමුට්ඨානික තිසමුට්ඨානික භූතුපාදායරූපසඞ්ඛාතස්ස කායස්ස.

චතු සමුට්ඨානික යනු කාමභූමියේ දී පමණක් කර්ම, චිත්ත, ඍතු, ආහාර යන හේතු සතර නිසා පහළ වන්නා වූ ශරීරය යි. ඒ ත්‍රිසමට්ඨානික යනු ආහාරජ රූප නූපදනා වූ බ්‍රහ්මයන්ගේ ශරීරය යි. මෙහි 'ශරීරය' ඒ කර්මාදී හේතූන් නිසා උපදනා වූ භූත රූප සහ උපාදා රූප සමූහය යි. මෙම පෙළ සහ අටුවා පාඨයන්ට අනුව " පසු පසු උපදනා වූ සිත් පච්ඡාජාත ප්‍රත්‍යය වේ, පෙර ඉපිද ස්ථිති ක්ෂණයට පැමිණි රූප සමූහය (පෙර සිත සමඟ හෝ වේවා, සිත් දෙක තුනක් ආදී වශයෙන් පෙර අවස්ථාවක දී ඉපිද තවමත් නිරුද්ධව නැති සියලු ම රූපයනට) ප්‍රත්‍යයෝත්පන්න ය වේ" යන අදහස හොඳින් පැහැදිලි වේ. එබැවින් ඒකජ, ද්විජ, ත්‍රිජ, චතුජ ආදී

යනුවෙන් ද පෙර පෙර සිත් හා ඉපිද යනුවෙන් ද බෙද දැක්වීමක් අවශ්‍ය නො වේ.

**ප්‍රතිසන්ධියේ ස්ථිති ක්‍ෂණයේ දී පච්ඡාජත ප්‍රත්‍යය ලැබේ ද නො ලැබේ ද?** ප්‍රතිසන්ධි සිත සමඟ ඉපදුණු කර්මජ රූපයෝ ප්‍රතිසන්ධි සිතේ ස්ථිති ක්‍ෂණයේ දී ප්‍රථම භවාංගයේ පච්ඡාජාත ශක්තියෙන් උපකාර ලබයි, උපකාර නො ලබයි යනුවෙන් ආචාර්ය මත දෙකකි. මෙම ග්‍රන්ථය 'උපකාර නො ලබයි' යන වාදයට පක්‍ෂ ය. 'උපකාර ලබයි' යන අදහස ගන්නා ආචාර්යයන් වහන්සේලා "ප්‍රථම භවාංගය තමාගේ උත්පාදයට පෙර ප්‍රතිසන්ධි ක්‍ෂණයේ ස්ථිති ක්‍ෂණයේ ඇති රූපයන්ට උපකාර වේ. උදහරණයක් ලෙස බක්කුල මහරහතන් වහන්සේ කුඩා කල ගංඉවුරේ ස්නානය කරවන විට මත්ස්‍යයෙකු විසින් ගිලින ලද අවස්ථාවේ දී ඉදිරියෙට ලබන්නා වූ අර්හත් ඥානයෙන් තමාගේ උත්පාදයට පෙර උපකාර කරන ලද බැවින් මරණයට පත් නොවී පවතින්නාක් මෙනි" යැයි කියත්. ඒ උදහරණය මුහුකුරා නොගිය (අසාර්ථක) උදහරණයකි. බක්කුල මහරහතන් වහන්සේ මරණයට පත් නොවීම ඒ අර්හත් මාර්ග ඥානයෙහි උත්පාදයට පෙර උපකාර කළ බව සැබවි. එය ඤාණවිප්ඵාර ඍද්ධිය යි. "මතු උපදින්නා වූ ඤාණයේ ආනුභාවයෙන් හට ගන්නා වූ ඍද්ධිය යැයි අදහස් වේ. සාමාන්‍ය සිත්වල එබඳු ආනුභාවයක් නොමැත. ඒ ආනුභාවය නිවැරදි නම් (ඒ අදහස නිවැරදි නම්) කවර හෙයකින් ස්ථිති ක්‍ෂණයේ දී උපකාර වන්නේ ද උත්පාදයේ දී උපකාර විය යුතු නො වේ ද (ඒ ආචාර්යයන් වහන්සේලා රූප කාණ්ඩයේ දී " පච්ඡාජාතාදිපච්චයුපත්ථම්භලාභෙන උතුඔජානං බලවභාවො" යන අභිධම්මත්ථවිභාවිනී ටීකාවේ එන පාඨය සාධක පාඨයක් ලෙස දක්වති. එය සාධක නොවන ආකාරය භාෂාටීකා රූපසමුට්ඨාන කාණ්ඩයේ දී දැක්වීය.

තවදුරටත් - පසු පසු සිත් තමාගේ උත්පාදයට පෙර උපකාර කරයි යන වාදය දරන ආචාර්යයන් වහන්සේලා විසින් පච්ඡාජාත ප්‍රත්‍යයෙහි දක්වන "ජාත" යන වචනය, විප්‍රයුක්ත ප්‍රත්‍යය, අත්ථි ප්‍රත්‍යය, වර්තමාන සහ අතීත ප්‍රත්‍යයන් යන කොටස් පිළිබඳව සිතිය යුතුය.

'ජාත' ශබ්දය "උපදුණු, වර්තමානයේ පහළව පවතින" යන අර්ථ දෙක ප්‍රකාශ කරයි. "උපදින්නේය" යන අර්ථ ප්‍රකාශ නො කරයි. ('ත' ප්‍රත්‍යය අනාගත අර්ථය නො දක්වයි.)

විප්‍රයුක්ත ප්‍රත්‍යයේ ස්වභාවය වනාහි "සම්ප්‍රයුක්ත වේ ද" යැයි සංශයක් පහළ වීමට තරම් එකට (සමීපව) පවත්නා ධර්මයන්

සම්ප්‍රයුක්ත නොවන බව දැක්වීමට විප්‍රයුක්ත ප්‍රත්‍යය දැක්වීම යි. ප්‍රතිසන්ධි සමඟ උපදින්නා වූ කර්මජරූපයෝ ප්‍රතිසන්ධි සිතෙහි ස්ථිති, භඞ්ග ක්‍ෂණවල දී ප්‍රථම භවාංගය සමග අනික් පැත්තට තවමත් පැමිණ නොමැත[1]. එසේ අනික් පැත්තට තවමත් නොපැමිණි බැවින් සම්ප්‍රයුක්ත වේ ද නැද්ද පිළිබඳව සංශයක් නොමැත. ප්‍රථම භවාංගයේ උත්පාද ස්ථිති භඞ්ගයන් සමඟ එකට ඉපදුණු රූප සියල්ල ම ප්‍රථම භවාංගය හා සමඟ අනික් පැත්තේ පවතී. එ අවස්ථාවේ දී පසුව උපදින්නා වූ භවාංගය පෙර පහළ වූ රූපයන්ට උපකාර කරන තැන "සම්ප්‍රයුක්ත වශයෙන් මිශ්‍රව පවතී ද" යන සංශය ඇති වන බැවින් තමාව හා අනික් පැත්තේ පවතිනුයේ නමුදු සම්ප්‍රයුක්ත නොවන බව ප්‍රකට කිරීම සඳහා " පච්ඡාජාත" විප්‍රයුක්ත යැයි නැවතත් වදාළහ.

අත්ථි ප්‍රත්‍යයෙහි ස්වභාවය වනාහි ප්‍රත්‍ය ප්‍රත්‍යයෝත්පන්න දෙකෙහි ම විද්‍යමාන වෙමින් පැවතීම යි. අනාගතයේ පහළ වන්නා වූ ධර්මයන්හි අත්ථි ප්‍රත්‍යය නොමැත. ප්‍රථම භවාංගයේ ද ප්‍රත්‍යයෝත්පන්න වන රූපයන්ගේ ද ස්ථිති ක්‍ෂණයෙහි අත්ථි ප්‍රත්‍යය පවතින බැවින් පච්ඡාජාත අත්ථි යැයි නැවත වදාළහ. " පච්චුප්පන්නාව හොන්තෙත්ථ පච්චයා දස පඤ්ච" ආදී වශයෙන් කාලය බෙදා දැක්වීමේ දී ද මෙම අත්ථි ප්‍රත්‍යය වර්තමාන ප්‍රත්‍යයන්හි ඇතුළත් වේ. (අනාගතය සඳහා පමණක් වන්නා වූ ප්‍රත්‍යයන් නැත). ප්‍රත්‍යයෝත්පන්න සඳහා ද උත්පාද ස්ථිති යන අවස්ථා දෙක අතරින් එක් අවස්ථාවකට පැමිණ සිටිය යුතු වේ. එබැවින් " පච්ඡාජාත ප්‍රත්‍යය පහළ වීමට පෙර උපකාර වේ. ප්‍රතිසන්ධි සිත සමඟ ඉපදුණු කර්මජකාය ප්‍රතිසන්ධියේ ස්ථිති ක්‍ෂණයට පැමිණ තිබෙන විට ද ප්‍රතිසන්ධියේ ස්ථිති ක්‍ෂණයේ දී උපදින කර්මජ ඍතුජ කාය ප්‍රතිසන්ධියේ භඞ්ග ක්‍ෂණයට පැමිණ තිබෙන විට ද උපදින්නා වූ ප්‍රථම භවාංගය පච්ඡාජාත ප්‍රත්‍යයෙන් උපකාර වේ" යන අදහස මෙම ග්‍රන්ථය නො පිළිගනියි. ප්‍රතිසන්ධි සිතේ උත්පාද, ස්ථිති, භඞ්ගයන් සමඟ උපදින තරමක් ඉපිද ස්ථිතියට පැමිණ සිටින කර්මජ ඍතුජ කායට ප්‍රථම භවංගය ප්‍රත්‍යය වේ. පසු පසු සිත් ද තමා උපදින උපදින අවස්ථාවේ දී ස්ථිති ක්‍ෂණයට පැමිණ

---

[1] **ප්‍රතිසන්ධි හා සමඟ උපදින්නා -පෙ- අනික් පැත්තට තවමත් පැමිණ නොමැත.** - යම් අවස්ථාවකදී නාම ධර්ම ගැන සළකන විටදී ඒ නාම ධර්ම සමඟ අනිත් පැත්තේ පවතිනුයේ එම අවස්ථාවේදී විද්‍යමානව පවතින්නා වූ රූප ධර්මයන් ය. මේ පිළිබඳව තව දුරටත් විප්‍රයුක්ත ප්‍රත්‍යයෙහි විස්තර කොට ඇත.

සිටින්නා වූ රූප සියල්ලට ම විශේෂයකින් තොරව ප්‍රත්‍යය වේ යන අදහස පිළිගනියි.

**උපකාරය ලැබෙන ආකාරය -** "කර්ම, චිත්ත, ඍතු, ආහාර යන තමාට අදාළ වන හේතුන් නිසා පහළ වන්නා වූ රූපයන්ට පසු පසු සිත්වලින් උපකාර කිරීමේ කවර ප්‍රයෝජනයක් වේ ද" යැයි පැනයකි. පිළිතුර වනාහි - රූප සන්තතිය දීර්ඝ කාලයක් පවත්වා ගැනීමට උපකාර වීම යි. විස්තර කරන්නෙමි - තමාට අදාළ වන්නා වූ ප්‍රත්‍යයෝත්පන්න ධර්මයන්ට ප්‍රත්‍යය ධර්මයන් විසින් උපකාර කරනු ලබන විට 1. ජනක ශක්තිය 2. උපස්ථම්භක ශක්තිය 3. ජනක උපස්ථම්භක ශක්තිය වශයෙන් ශක්ති වර්ග තුන අතරින් එකකින් උපකාර කෙරේ. (මෙහි භේදය ඉදිරියේ දී කියනු ලබයි.) මෙම පච්ඡාජාත ප්‍රත්‍යයේ උපස්ථම්භක ප්‍රත්‍යය ඇත. තමාට අදාළ වන්නා වූ හේතුවෙන් ජනිත රූප ධර්මයන්ට ආධාර වීමෙන් ප්‍රත්‍යය වේ. බීජයකින් පහළ වූ ගසක් නැවත නැවතත් ජලය වත් නොකළහොත් මහත්ව නොවැඩී, වැඩි කල් නොගොස් විනාශ වී යන්නා සේ ද කර්මය මූලය කොට දෙමව්පියන්ගේ ශුක්‍රඩිම්බ හේතුවෙන් උපදින දරුවා මව්කිරි ලැබීම ආදී උපකාරයන් නොලැබීමෙන් ජීවත් වීමට නොහැකි වන්නා සේ ද කර්මය හේතුවෙන් උපදින කර්මජ රූපයෝ තමා නිරුද්ධ වන අවස්ථාවේ දී තමා හා සමාන රූප සන්තතිය පහළ වීමට උපකාර වේ. (අභිධර්මාර්ථ සංග්‍රහ භාෂාටීකාවේ රූප ජීවිත සම්බන්ධයෙන් කියවන්න) එමෙන් උපකාර වන්නා වූ අවස්ථාවේ දී චිත්තයන් විසින් පච්ඡාජාත ශක්තියෙන් උපකාර කිරීමෙන් ම ශක්තිමත් වීම මගින් දිගින් දිගට උපකාර වේ. චිත්තජ, ඍතුජ, ආහාරජ රූප සන්තතීන්හි ප්‍රවෘත්ති ක්‍රමයේ ද සුදුසු කාලය යම්තාක් වේ ද ඒ කාලය දක්වා ශක්තිමත්ව පැවතීම පිණිස චිත්ත චෛතසිකයෝ උපාකාර වෙති. මෙසේ පසු පසු උපදනා සිත් පච්ඡාජාත ශක්තියෙන් උපකාර වීම රූප සන්තතියේ චිර පැවැත්ම පිණිස යන ප්‍රයෝජනය ඇත යැයි දත යුතු වේ.

**ප්‍රත්‍යය වන අයුරු -** ප්‍රථම භවාංගය උපදනා අවස්ථාවේ දී ස්ථිතියට පැමිණෙන රූප සමූහයක් ඇත. ප්‍රථම භවාංගය ප්‍රත්‍යය වේ, ඒ රූප සමූහය ප්‍රත්‍යයෝත්පන්නය වේ. මේ ආදී ක්‍රමයෙන් චුති සිත දක්වා විස්තර කරගන්න.

**ප්‍රත්‍යනීක -** "චිත්ත චෛතසිකයෝ ප්‍රත්‍යයෝත්පන්නවල ඇතුළත් නොවන බැවින් ප්‍රත්‍යනීකයන් ඇහිදීමේ දී ගත යුතු වේ ද, අසඤ්ඤසත්ත්වය හැර සත්ත්වයන්ගේ සන්තානයෙහි ඇති රූපයන්හි ප්‍රත්‍යයෝත්පන්නවල ඇතුළත් වන විට කවර හේතුවක්

නිසා ප්‍රත්‍යනීකවල ඇතුළත් වන්නේ ද” යැයි සිතිය යුතු වේ. පච්ඡාජාත ශක්තිය ස්ථිති ක්‍ෂණයට පැමිණි පසු උපකාරක වේ. උත්පාදයේ දී උපකාරක නො වේ. එබැවින් ප්‍රත්‍යයෝත්පන්න පහළ නොවන්නා වූ උත්පාද ක්‍ෂණයේ රූප අපේක්‍ෂා කරමින් (අවිඥනක රූපයන් පමණක් නොව) සවිඥනක රූපයන් ද ප්‍රත්‍යනීකයන් සඳහා ගත යුතු වේ. ඒ සඳහා “පශ්චිම නාම ස්කන්ධයන් හා උපදනා චිත්තජ රූපයෝ ය” යැයි ඉහත ත්‍රිරාශියෙහි දක්වා ඇති ආකාරය පරිපූර්ණ වූවක් නො වේ. පසු පසුව උපදින රූප හෝ වේවා, පෙර පෙර උපදින රූප හෝ වේවා සියලු චිත්තජ, ආහාරජ, ඍතුජ, ප්‍රවෘත්ති කර්මජ රූපයන් සහ මුලින් ම උපදින ප්‍රතිසන්ධි සිත සමඟ උපදින ප්‍රතිසන්ධි කර්මජ රූප ම ප්‍රත්‍යනීකයේ ඇතුළත් වේ. අසඤ්ඤ සත්ත්ව කර්මජ රූප සහ බාහිර කර්මජ රූප සඳහා කිවයුත්තක් නැත. එබැවින් පච්චනීයපට්ඨාන පාළියෙහි “පච්ඡාජාත පච්චනීකය අධිපති පච්චනීකය හා සමාන ය” යැයි දක්වේ. අධිපති පච්චනීකයේ දී “කුසලං එකං ඛන්ධං පටිච්ච තයො ඛන්ධා චිත්තසමුට්ඨානඤ්ච රූපං -පෙ- පටිසන්ධික්ඛණෙ විපාකාබ්‍යාකතං එකං ඛන්ධං පටිච්ච තයො ඛන්ධා කටත්තාරූපං” ආදී වශයෙන් දක්වන ලදී.

මෙම පාළිය පිළිබඳව අවධානය නොකළ ආචාර්යයන් වහන්සේලා “සියලු එකුන්අනූ චිත්ත ය, චෛතසික දෙපණස ය, බාහිර රූපයෝ ය, අසංඥ සත්ත්ව කර්මජ රූපයෝ ය. නිරෝධසමාපත්ති වීථියෙහි අන්තිම නේවසඤ්ඤානාසඤ්ඤායතන ජවනය හා උපදනා චිත්තජ රූපයෝ ය, ඒ අන්තිම ජවනයෙන් පසු නිරෝධ සමාපත්තියෙන් නැගිටීමෙහි දී ඇති වන අනාගාමි අර්හත් ඵල චිත්තයන් ඇති වීමට පෙර ඒ සන්තානයෙහි ඉපිද නිරුද්ධ වන ආහාරජ රූපයෝ ය, ඍතුජ රූපයෝ ය, ප්‍රවෘත්ති කර්මජ රූපයෝ ය, ච්‍යුති චිත්තය හා උපදනා චිත්තජ රූපයෝ ය, ඍතුජ රූපයෝ ය, ආහාරජ රූපයෝ ය යන මොවුහු පච්ඡාජාත ප්‍රත්‍යයාගේ ප්‍රත්‍යනීක ධර්මයෝ ය” යැයි තවත් නය ක්‍රමයකින් දක්වූහ. ඒ ආකාරයෙන් දක්වීමේ විශේෂ ඵලයක් නොමැත.

එය නිවැරදි කළහොත් “ප්‍රතිසන්ධි ආදී පෙර පෙර සිත්වල ක්‍ෂණත්‍රය සමඟ එකට ඉපිද රූපයාගේ ස්ථිතියට පැමිණි ඒ තිසමුට්ඨානික, චතුසමුට්ඨානික රූප සමූහය යන මෙම ධර්මයෝ පච්ඡාජාත ප්‍රත්‍යයේ ප්‍රත්‍යයෝත්පන්න ධර්මයෝ වෙත්. සිත් එකුන්අනූව ය, චෛතසික දෙපණස ය, සවිඥනක සන්තානයෙහි උත්පාද ක්‍ෂණයෙහි ඇති චිත්තජ රූප, ප්‍රතිසන්ධි කර්මජ රූප, ආහාරජ රූප, ඍතුජ රූප, ප්‍රවෘත්ති කර්මජ රූප, සෙසු බාහිර රූප, අසඤ්ඤසත්ත්ව කර්මජ රූපයෝ යන මෙම ධර්මයෝ පච්ඡාජාත

ප්‍රත්‍යයේ ප්‍රත්‍යනීක ධර්මයෝ වෙත්" යනුවෙන් මෙසේ දැක්විය හැකිය. ප්‍රත්‍යය ධර්මයන්හි නිවැරදි කළ යුත්තක් නැත.

**ජාත වර්ග තුන** - සහජාතයෙහි 'ජාත' ශබ්දය උත්පාද, ස්ථිති, භඞ්ග අවස්ථාවෙහි ඇති නාම රූප දෙවර්ගය දක්වයි. පුරේජාතයෙහි 'ජාත' ශබ්දය උත්පාද ස්ථිති අවස්ථාවේ ඇති රූප පමණක් දක්වයි. පච්ඡාජාතයෙහි ඇති 'ජාත' ශබ්දය උත්පාද, ස්ථිති අවස්ථාවෙහි ඇති චිත්ත චෛතසික සඞ්ඛ්‍යාත නාම ධර්මයන් පමණක් දක්වයි. මෙසේ 'ජාත' ශබ්දය, ශබ්ද වශයෙන් එකිනෙකට සමාන වූයේ නමුදු ඒ ඒ ප්‍රත්‍යය සඳහා නොයෙක් ආකාරයෙන් ස්වරූපාර්ථ ගැනීමේ හේතුව ඒ ඒ ප්‍රත්‍යයන්ගේ ස්වභාවය නුවණින් විමසා බැලූ විට ප්‍රකට වන්නේය. (ඇතැම් ගුරුවරු සහජාතයෙහි 'ජාත' සඳහා උත්පාද ස්ථිති අවස්ථා දෙකෙහි ඇති නාමරූපයන් පමණක් ගන්නා අතර භඞ්ග ක්ෂණයේ දී නාමරූපයන් නො ගනිති. එම අදහස පිළිබඳව සහජාත ශක්තියෙහි ඇති අත්ථි සඳහා භඞ්ග ක්ෂණයේ දී ධර්මයන් ගන්නා ආකාරය අනුව සිතා බලන්න.)